ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ ලැබීම් මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) වටිනාකම රු.23,831,212 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණද, විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වටිනාකම රු.22,838,875 ක් වූයෙන් රු.782,559 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	හඳුන්වාදී ඇති ගිණුම්ගත කිරීමේ මෘදුකාංග වන CIGAS, ITMIS හා VAT Return භාරදීමේ ක්‍රමවේදය මත පැන නගින කරුණක් වන බව.	විධිමත් පරීක්ෂාවක් කර දෙපාර්තමේන්තුවේ ලේඛන නිවැරදි කිරීමටත්, ගණනය කිරීම් නිවැරදිව සිදු කිරීම තහවුරු වන අභ්‍යන්තර වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීමටත් පියවර ගත යුතුය.

(ආ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුල ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එකතුව රු.50,718,236 ක් වූ මූලධන වියදම් දරා තිබුණත්, ACA - 6 ආකෘතිය තුළ එම වටිනාකම ප්‍රාග්ධනිත කිරීම රු.9,663,966 ක් එනම්, සියයට 19 ක් පමණක් විය. ඒ අනුව මූලධන වියදම්වලින් සියයට 81 ක් තුල පැවති ප්‍රාග්ධනිත ස්වරූපී වියදම් හඳුනාගෙන ACA - 6 ආකෘතිය තුළ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.	රු.41,054,270 ක් වූ වියදම මෙතෙක් ප්‍රාග්ධනිත කර නොමැති බවත් අවසන් ගෙවීම කළ පසුව ප්‍රාග්ධනිත කර ගිණුම් ගත කරන බව.	විධිමත් ක්‍රමවේදයක් යටතේ ප්‍රාග්ධන වියදම් අදාල වත්කම් කාණ්ඩ යටතේ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ ප්‍රධාන පිවිසුම අසල 2013 වර්ෂයේදී ඉදිකරන ලද වෙළඳ කුටි 12 ක් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	වෙළඳ කුටි 12 ක් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු යුතුය.
(ii)	ACA - 2 (ii) ආකෘතියේ වියදම් ප්‍රකාශය තුළ මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් යටතේ වැය ශීර්ෂය 322 හි 2105 වැය විෂය මඟින් සමාලෝචිත වර්ෂය තුල දරන රු.16,864,235 ක් වූ වැය තුළ ඇතුළත් ප්‍රාග්ධනිත කළ යුතු ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් ACA - 6 ආකෘතිය තුළ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, එම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකරන ලද ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් හඳුනාගෙන නොනිමි වැඩ යටතේ ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.	රු.16,846,235 ක් වූ වැය තුළ ඇතුළත් ප්‍රාග්ධනිත කළයුතු ඉඩම් ප්‍රාග්ධනිත කිරීමටත් වැඩ අවසන් නොකරන ලද ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් හඳුනාගෙන නොනිමි වැඩ යටතේ ගිණුම්ගත කිරීමටත් අදාළ විෂයන් වෙත උපදෙස් ලබාදුන් බව.	විධිමත් වැඩපිළිවෙලක් යොදා නිවැරදි කිරීම් සිදු කිරීමටත්, ඉදිරියේදී නිවැරදිව හා කාලීනව ගිණුම් යාවත්කාලීන වන බව තහවුරු වන අභ්‍යන්තර වැඩපිළිවෙලක් සැකසීමටත් පියවර ගත යුතුය.

(ඈ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂ වූ රු.974,526 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවද එම ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා නොතිබීමෙන් එම වටිනාකමින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගැනීමට අදාළ විෂයයන් වෙත උපදෙස් ලබාදුන් බව.	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් වන බව තහවුරු වන අභ්‍යන්තර වැඩපිළිවෙලක් සැකසීමට පියවර ගත යුතුය.

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) පොරොත්තු ලේඛනය		
ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 4.3.4 ප්‍රකාරව රජයේ ශ්‍රේණි සම්බන්ධයෙන් පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ලේඛනයක් පවත්වාගෙන යාමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදී ඇති බව.	ආයතන සංග්‍රහය ප්‍රකාරව පොරොත්තු ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii) හානි පිළිබඳ ලේඛනය		
මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	අදාළ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබාදී ඇති බව.	ලේඛන යාවත්කාලීන නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමටත්, රෙගුලාසි ප්‍රකාරව ලේඛන යාවත්කාලීන කිරීමටත් කටයුතු කළ යුතුය.

(ඊ) විගණන සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ACA 6 ආකෘතියේ එකතුව රු.8,061,011,502 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවූයෙන් මෙම වටිනාකමේ නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.	එකතුව රු.8,061,011,502ක් වූ දේපල පිරියත හා උපකරණ වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාළ සමීක්ෂණ වාර්තා විද්‍යුත් තැපැල මඟින් විගණන අංශය වෙත යොමු කර ඇති බව.	භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ACA 6 ආකෘතියේ අපහරණය කිරීම් ලෙස රු.29,944,850 දක්වා තිබූ අතර එම ශේෂය තුල වූ පිරිවැය රු.45,600 ක් වූ අයිතම 9 ක භාණ්ඩවල පිරිවැය අපහරණ වාර්ථාවේ සඳහන් කර නොතිබූ අතර, ඉතිරි වටිනාකම	දේපල පිරියත හා උපකරණ වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාළ සමීක්ෂණ වාර්තා විද්‍යුත් තැපැල මඟින් විගණන අංශය වෙත යොමු කර ඇති බව.	- එම -

සනාථ කිරීම සඳහා සමීක්ෂණ වාර්තා හෝ වෙනත් ලියවිලි විගණනයට ඉදිරිපත් නොවූ බැවින්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අපහරණ වටිනාකම විගණනයේදී තහවුරු කරගත නොහැකිවිය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු සමාලෝචිත වර්ෂයේ (ඇ) (i) ඡේදයේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ රු.800,000,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.1,150,000,000 ක් ලෙස සංශෝධනය කර තිබීම හේතුවෙන්, මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර සියයට 44 ක විචලනයක් පැවතුණ හෙයින් මූලික ආදායම් ඇස්තමේන්තු විධිමත් පරිදි සකසා නොතිබුණු බව නිරීක්ෂණය විය.	දෙස් විදෙස් සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධන ප්‍රවණතා සැලකිල්ලට ගැනීම හා ලෝකයේ රටවල් අතරින් නැරඹීම සඳහා හොඳම ගමනාන්තය සහිත රට ශ්‍රී ලංකාව පත්වීම තුළ අපේක්ෂිත සංඛ්‍යාවට වඩා විශාල විදේශීය සංචාරකයින් ප්‍රමාණයක් පැමිණීම හා දේශීය සංචාරකයන්ද කැපී පෙනෙන ලෙස ඉහළ යාම.	ඇස්තමේන්තු හැකිතාක් දුරට තාත්විකව හා නිවැරදිව පිළියෙල කිරීමට පියවර ගත යුතුය.
(ආ)	2023 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු රු.3,691,000 ක හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව හා නඩුව සමථයකට පත්වී නොමැති බැවින් ඊට අදාළ හිඟ මුදල සම්බන්ධව මෙතෙක් කටයුතු කර නොමැති බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, පවතින හිඟ ආදායම කඩිනමින් අයකර ගැනීමටත් පියවර ගත යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ රු.752,050,000 ක ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදන අතුරින් රු.60,377,823 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණද, ඒ තුල වැය විෂයයන් 17 ක සියයට 05 ත් සියයට 100 ත් දක්වා ප්‍රමාණයක් ඉතිරිවීම් පැවති බව නිරීක්ෂණය විය.	සියයට 8 ක් ඉතිරිව ඇත්තේ ජනාධිපති ලේකම් සමඟ එළඹ ඇති කාර්යසාධන ගිවිසුම අනුව සියයට 6 ක් ප්‍රතිපාදන අවුරා තබන ලෙස දැන්වූ බව හා ඉතිරි වැය විෂයන්වලට අදාළ හේතු ඉදිරිපත් කර ඇති බව.	ඉදිරියේදී නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු සැකසීමටත්, ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය තුලදී මුදල් රෙගුලාසි 94 හා 2017 අප්‍රේල් 27 දිනැති 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 ඡේදයට අනුකූල නොවන ලෙස වැය විෂයන් 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.294,569 ක බැදීම් ඇතිකර ගෙන තිබුණි.	ඉදිරියේදි ප්‍රතිපාදන ඉක්මවා බැරකම් හෝ බැදීම් ඇතිකර නොගන්නා බව.	ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් ඇති කර ගැනීම වළක්වා ගැනීම සඳහා වියදම් අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය	-	උද්‍යාන 05 කට අයත් හෙක්ටෙයාර් 355.8744 ක වපසරියකින් යුතු ඉඩම් හා මහවැලි අධිකාරිය සතුව පවතින පුහුණු මධ්‍යස්ථානය හා වියළි කළාපීය උද්භිද උද්‍යානයට අයත් හෙක්ටයාර් 124.8423 ක වපසරියකින්	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම් විධිමත් පරිදි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරා දී නොමැති වීම සහ මීගලෑව හරිත පියස සහ වියළි කලාපීය	ඉඩම් ආඥා පනත අනුව කටයුතු කර කඩිනමින් දෙපාර්තමේන්තුව ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

			යුත් ඉඩම් 02 ක්ද ඇතුළුව හෙක්ටයාර් 480.7167 ක ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.	උද්භිද උද්‍යානයේ ඉඩම් සඳහා මහවැලි අධිකාරිය විසින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත කොන්දේසි සහිත පැවරීමක් සිදු කර ඇති බව.	
(ආ)	2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන මුදල් අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	-	වර්ෂ 05 කට වරක් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලිවල රු.7,631,911,841 ක් වූ පිරිවැය වටිනාකම අවසන් වරට 2016 වර්ෂයේදී තක්සේරු කර තිබුණි.	නැවත තක්සේරුවක් කරන ලෙස අදාළ අංශ දැනුවත් කර ඇති බවත් නව තක්සේරුව ලද පසු එම වටිනාකම් සිගාස් වැඩසටහනේ ඇතුළත් කර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර අදාළ පරිදි වාර්තා කිරීම් සිදු කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4, හා 6.3 වගන්ති	3,778,973	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විශ්‍රාම ගොස් ඇති, මියගිය, වැඩ තහනම් කළ හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 35 දෙනෙකුගේ ණය ශේෂයන් අය කර නොතිබුණි.	විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකුගේ ණය ශේෂ අයකර ඇති බවත්, වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.83,300 ක් අයවිය යුතු බවත්, සේවය හැරගිය හා මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකරන බව.	විධිමත් පරීක්ෂාවක් කර ණය ශේෂ කාලීනව අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් පිළිබඳව පියවර ගැනීමටත්, හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (3) රෙගුලාසිය	6,742,723	කාලය ඉකුත් වූ තැන්පතු 19 ක් නිරවුල් කර නොතිබුණි.	තැන්පතු නිදහස් කිරීමට හා රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බවත්, අවසන් බිල්පත් පියවා නොමැති ව්‍යාපෘතිවල රැඳවුම් මුදල් මේ වන විට රඳවාගෙන ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇප තැන්පතු කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය.

3.5 බැංකු ගිණුම් මෙහෙයවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුමක 2024 නොවැම්බර් 08 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව රු.1,265,208 ක හඳුනා නොගත් ගෙවීම් පැවතුණි.	වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නිවැරදි කර ඇති බව.	අදාල ගෙවීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් අදාල මූලාශ්‍ර ලේඛනද සමඟ විගණන පරීක්ෂාව සඳහා කඩිනමින් ඉදිරිපත් කිරීමත් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 2සැප්තැම්බර් 14 දින මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ දිග අඩි 1100 ක් හා උස අඩි 8 කින් වන දැල් වැටක් සවිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.3,841,200 ක (වැට් රහිත) මුදලකට පුද්ගලික සමාගමකට පිරිනමා එම ඉදිකිරීම 2023 නොවැම්බර් 07 දින අවසන් කර ඇති අතර, රු.4,417,380 ක (වැට් සහිත) මුදලක් ගෙවීම් කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාළ ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී අයිතම 04 කට අදාළව වෙළඳපළ මිල ගණන් ඉක්මවා රු.1,858,689 ක් අසාමාන්‍ය අගයක් ඇතුළත් කර තිබුණි.	අයි ඇස්තමේන්තු විස්තරය පළාත් සභාව කොටසේ වෙල්ඩර් සඳහා දින 1.25ට අමතරව Skilled labour සඳහා දින 3කුත් ඇතුළත් විය යුතුය. පළාත් සභා විශ්ලේෂණයේ වෙල්ඩිං රොඩ් 1.25kg නොව 1.5kgක් යොදවා ඇත. නමුත් අප විසින් යොදවා ඇත්තේ 1kg පමණි. මෙයට (ආ) හි සඳහන් කර ඇති පිළිතුරට අමතරව rate ගණන වැඩි වීම වළක්වා ගැනීම සඳහා පහත දක්වන කොටස් වලට SSR පිළියෙළ කිරීමේදී මුදල් එකතු කර නොමැති බව.	විධිමත් ස්වාධීන පරීක්ෂාවක් සිදු කර අසාමාන්‍ය මිල ගණන් යොදා ඇස්තමේන්තු සකසා තිබේද යන්න සොයා බලා අදාල පරිදි කටයුතු කළ යුතුය.

4.2 දෙපාර්තමේන්තුව සතු වත්කම් බදු දීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) රාජකීය උද්භිද උද්‍යානයේ පිටවීමේ පර්යන්තයේ පිහිටි ගොඩනැගිල්ල ලක්සල ආයතනය වෙත බදුදීම		
(i) 2023 ඔක්තෝබර් 25 දින දෙපාර්ශවය අතර පැවති රැස්වීම් වාර්තාවක් පමණක් පදනම් කරගෙන ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2023 දෙසැම්බර් 22 දින සිට 2033 දෙසැම්බර් 21 දක්වා අවුරුදු 10 ක කාලයකට ගොඩනැගිල්ල බදුදීමට එකඟ වී වසර දෙකක කාලයකට ගිවිසුම් ගතවී තිබුණි.	රාජ්‍ය ආයතන දෙකක් අතර අත්සන් කරනු ලැබූ විධිමත් ගිවිසුමක් බැවින් ප්‍රසම්පාදන කමිටු තීරණයක් ලබානොගත් බව හා ලක්සල ආයතනය සමඟ අත්සන් කර ඇති ගිවිසුමේ කොන්දේසි අංක 11 ප්‍රකාරව බදු කාලය දීර්ඝ කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පැවරී ඇති බැවින් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණයක් ලබා ගැනීම අවශ්‍ය නොවන බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයට පාඩුවක් සිදු වී ඇත්නම් එය අය කර ගැනීමටත්, අවිධිමත් පරිදි කටයුතු කළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ii) රජයේ තක්සේරුව ලැබීමට පෙර මාසික කුලිය රු.412,500 ක් ලෙස ගිවිසුම්ගත වී තිබුණ අතර, නව තක්සේරුව අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් බදු ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. එම 2024 දෙසැම්බර් මාසයේදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති තක්සේරුව මත අය කල යුතු මාසික කුලිය වන රු.850,000 ක් අයකර ගැනීමේ අවස්ථාව අහිමිවීමෙන් 2024 වර්ෂය සඳහා රු.5,250,000 ක බදු කුලී ආදායමක් අහිමිවී තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ගොඩනැගිලි තක්සේරුකර වාර්තා ලබාදීමට ප්‍රමාදවීම හා නව තක්සේරුව ලද පසු ඒ අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කළහොත් දැනට අයකරන කුලියට වඩා අඩු කුලියක් තක්සේරු කළහොත් රජයට ආදායමක් අහිමිවන බව.	- එම -

(iii)	ආයතනය සමඟ ගිවිසුම්ගත වීමේදී ගිවිසුම උල්ලංඝනය කළහොත් දෙපාර්තමේන්තුව ආරක්ෂා කිරීම සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ගිවිසුම්ගත වීමට පෙර ලබාගත යුතු නමුත්, කාර්යසාධන සුරක්ෂණය ගිවිසුම්ගතවී මාස 08 කට පසු ලබාගෙන තිබුණි.	ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වලක්වා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් දී ඇති බව.	- එම -
(iv)	බදු ගිවිසුමෙහි 2 වන වගන්තිය ප්‍රකාරව දඩ මුදල් අයකළ යුතු වුවද, එම වගන්තිය ප්‍රකාරව ප්‍රමාද කාලය සඳහා රු.48,300 ක දඩ මුදල් අය කර නොතිබුණි.	දඩ මුදල් අයකිරීමට කටයුතු කිරීම පිළිබඳව ලක්සල ආයතනය දැනුවත් කර ඇති බව හා විගණනයෙන් පෙන්වාදී ඇති දඩ මුදල ගෙවන ලෙසට දැනුවත් කර ඇති බව.	දඩ මුදල වහාම අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කැපටේරියා ආපනශාලාව 2024/2025 වර්ෂය සඳහා බදුදීමට අදාල ටෙන්ඩර් කැඳවීමේදී ලංසු ඉදිරිපත් කර ඇති ආයතන 2 න් එක් ආයතනයක් පමණක් මූලික ලංසු පරීක්ෂාවේදී තිබිය යුතු කොන්දේසි සම්පූර්ණ කර තිබුණි. එම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසුවේ ආහාරපාන සඳහා මිල ගණන් සැසඳීම සඳහා වෙනත් සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුවක් නොමැති බැවින් නැවත මිල ගණන් කැඳවීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් වාර්තාවෙන් නිර්දේශ කර තිබුණි. එම නිර්දේශ නොසලකා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන 02 ක ලංසු ඇගයීමට කටයුතු කර උපරිම ලංසුව රු.1,225,000 ක්ව තිබියදී රු.790,000 ක මාසික බදු මුදලකට ආපනශාලාව බදුදීමට තීරණය කිරීමෙන් 2024 මාර්තු මස 01 දින සිට 2025 පෙබරවාරි මස 28 දින දක්වා රු.435,000 බැගින් මාස 12 ක කාලයකට රු.5,220,000 ක ආදායමක් අහිමි වී තිබුණි.	ප්‍රසම්පාදන කාර්යයක් පිළිගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ ලබා නොදුන් අවස්ථාවක ලංසු ලියවිලි සමාලෝචනය කර ලංසුකරුවකු තීරණය කිරීමේ අවසරය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය මගින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත ලබාදී ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයට පාඩුවක් සිදු වී ඇත්නම් එය අය කර ගැනීමටත්, අවිධිමත් පරිදි කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	සුභසාධක ආපනශාලාව බදුදීමට 2023/2024 වර්ෂය සඳහා බදුකරු තෝරා ගැනීමේදී 2023 මාර්තු 21 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව අදාළ තෝරාගත් ලංසුකරු විසින් පලපුරුද්ද හෝ වර්තමාන ව්‍යාපාර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබියදීත් හා 2023/2024 වර්ෂයේදී ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කර තිබියදීත්, ඒ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව එම බදුකරු වෙතම 2024/2025 වර්ෂය සඳහා ලංසු කැඳවීමකින්	සේවකයන්ගේ සුභ සාධනය සලකා ඉතා ඉක්මනින් විවෘත කර පවත්වාගෙන යාම ඉතාමත් අත්‍යාවශ්‍ය බැවින් මෙම කොන්ත්‍රාත්කරු වෙත ලබාදී ඇති බවත්, නොමිලේ ලංසු ලියවිලි පරීක්ෂා කර බැලීමට අවස්ථාව පවතින බව පුවත් පත් දැන්වීම් මගින් උදාකර	විධිමත් පරීක්ෂණයක් පවත්වා රජයට පාඩුවක් සිදු කර ඇත්නම් ඒවා අයකර ගැනීමටත්, අවිධිමත් පරිදි කටයුතු කළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.

	තොරව ආපනශාලාව බදුදීමට 2024 ජූනි 13 දින තීරණ ගෙන තිබුණි. තවද, රජයේ තක්සේරුව ලද පසු ඒ අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන්, නව තක්සේරු මත සමාලෝචිත වර්ෂයේදී මාස 6 කට රු.18,150 ක ආදායම් අහිමි වීමක් සිදු වී තිබුණි.	ඇති බව.	
(ඇ)	2024 ජූනි 01 සිට 2025 මැයි මස 31 දින දක්වා වසරක කාලයට කිරිහල බදුදීමේදී ලංසු ලේඛනවල විශාල බැහැරවීමක් වන පූර්ව සුදුසුකම් ඉදිරිපත් කර නොතිබියදී තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොසළකා ප්‍රසම්පාදන කැඳවීමෙන් පසු ලංසුකරු විසින් 2024 පෙබරවාරි 13 දින ලබාගත් වෙළඳ බලපත්‍රයක් මත පදනම්ව පෞද්ගලික ආයතනයක් ඉදිරිපත් කල මසකට රු.786,700 ක ලංසුව පිළිගැනීමෙන් අනෙක් උපරිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය මාසික බදු මුදල වන රු.1,225,000 ක කුලිය ලබා ගැනීමේ අවස්ථාව අහිමිවීමෙන් වසරකට ආයතනයට රු.5,259,600 ක ආදායම් අහිමි වීමක් සිදු වී තිබුණි. තවද, නව තක්සේරුව ලද පසු ඒ අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන්, මාසිකව රු.13,300 ක් බැගින් 2024 ජූනි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මාස 07 ක කාලයක් සඳහා රු.93,100 ක බදු කුලී ආදායමක් අහිමිවී තිබුණි.	ප්‍රසම්පාදන කාර්යයක් පිරිනැමීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ ලබා නොදුන් අවස්ථාවක අදාළ ලංසු ලියවිලි නැවත සමාලෝචනය කර කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ජයග්‍රාහී ලංසුකරුවකු තීරණය කිරීමේ අවසරය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය මඟින්ද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු වෙත ලබා දී ඇති බව හා නව තක්සේරුව ලද පසු ඒ අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කළහොත් දැනට අයකරන කුලියට වඩා අඩු කුලියක් තක්සේරු කළහොත් රජයට ආදායමක් අහිමිවන බව.	- එම -

4.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සුවහස් මල්වගාකරුවන් වෙත බෙදා දීම සඳහා 2021 හා 2023 වර්ෂවල මිලදී ගෙන තිබූ රු.6,886,585 ක් වටිනා අයිතම 17 ක් අදාළ මල්වගාකරුවන් වෙත බෙදා දීමට කටයුතු නොකර වසර 01 ත් වසර 03 ත් අතර කාලයක් ගබඩා කර තිබුණි. තවද UV ප්‍රතිරෝධක පොලිතීන් හා සෙවන දැල් රෝල් 13 ක් දීර්ඝ කාලයක් අනාරක්ෂිත ලෙස තබා තිබුණි.	2025 පෙබරවාරි මස නම් කළ කමිටුවක් මගින් එම ද්‍රව්‍ය බෙදාදීම සඳහා සුදුසු වගා කරුවන් තේරීමටත් එලෙස සුදුස්සන් තෝරා ගැනිමෙන් අනතුරුව එම ද්‍රව්‍ය බෙදාදීමට කටයුතු කරන බව.	වත්කම් අරමුණුගත කාර්යය සඳහා යොදා නොතිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාල වගකිවයුතු නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, මෙම වත්කම් ඵලදායීව යෙදවීමට කඩිනම් පියවර ගැනීමත් කළ යුතුය.

(ආ)	2016 වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කළ වායුසමීකරණ යන්ත්‍ර 04 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර කාර්යාල ගබඩා තුල නිෂ්කාර්යව පැවතුණි.	2025 වසරේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත යොමුකර ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යන බව.	මෙම යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණයට කටයුතු කළ යුතුය.
(ඇ)	මල් වගා පර්යේෂණ හා සංවර්ධන අංශයේ ඇන්තුරියම් ඒකකයේ සෙවන දැල් ගෘහ අලුත්වැඩියා කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.1,130,220 කට මිලදීගත් සෙවන දැල් 26 න් රු.695,520 ක් වටිනා සෙවන දැල් 16 ක් අවුරුදු 07 කට ආසන්න කාලයක් ඇන්තුරියම් ඒකකයේ ගබඩාවේ නිශ්කාර්යව ගබඩා කර තිබුණි. තවද අංශය තුල සෙවන දැල් තිබියදී 2021 වර්ෂයේදී එම වර්ගයේම සෙවන දැල් රෝල් 13 ක් එකක් රු.3,297 බැගින් සුවහස් මල් වගාකරුවන්ට බෙදාදීම සඳහා මිලදි ගෙන තිබුණි.	අතිරික්ත සෙවන දැල්වලින් කොටසක් ඇන්තුරියම් අංශයේ කටයුතු සඳහා භාවිතා කිරීමට ඉතිරි ප්‍රමාණය වෙනත් උද්භිද උද්‍යානවල අවශ්‍යතාවයන් විමසා ලබාදීමට කටයුතු සිදුකරමින් පවතින බව.	වත්කම් අරමුණුගත කාර්යය සඳහා යොදා නොතිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාල වගකිවයුතු නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත්, මෙම වත්කම් ඵලදායීව යෙදවීමට කඩිනම් පියවර ගැනීමත් කළ යුතුය.
(ඈ)	ගම්පහ උද්භිද උද්‍යානයේ ගබඩාව තුල 2013, 2015 හා 2017 වර්ෂවල මිලදීගත් වටිනාකම සනාථ කර ගැනීමට නොහැකි වූ උපකරණ 16 ක් මාස 02 ත් මාස 04 ත් අතර කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණ අතර, අළුත්වැඩියා කිරීමටද කටයුතු කර නොතිබුණි.	උපකරණ 16 න් උපකරණ 07 ක් 2024 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණයේදී වෙන්දේසි කිරීමටත් ඉතිරි යන්ත්‍ර 09 පවතින ප්‍රතිපාදන මත අළුත්වැඩියා කිරීමට සැලසුම් කර ඇති බව.	- එම -
(ඉ)	ගම්පහ උද්භිද උද්‍යානයේ පැල තවානට අදාළව සිදු කළ නියැදියක් පරීක්ෂා කිරීමේදී පැල වර්ග 12 කට අදාළව රු.42,300 ක් වටිනා පැල 423 ක ඌනතාවයක්ද හා පැල වර්ග 03 කට අදාළව රු.3,700 ක් වටිනා පැල 37 ක අතිරික්තයක්ද පැවතුණි. තවද ඇන්තුරියම් හා ඕකිඩ් ගෘහයෙහි ලේඛනගත කර නොමැති උඩවැඩියා පැල මව් ශාක 594 ක අතිරික්තයක් හා 56 ක ඌනතාවයක්ද පැවති අතර, පැල ලේඛනයේ සටහන් කර නොමැති වර්ග 06 කට අයත් පැල 1170 ක්ද පැවතුණි.	2025 වර්ෂයේ සිට ප්‍රභේද වෙන් කර තොග පොතක් නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	විධිමත් සමීක්ෂණයක් සිදු කර ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන්ට අදාල පියවර ගත යුතු අතර, ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමට පියවර ගත යුතුය.
(ඊ)	විධිමත් ඇගයීමකින් හා සැලැස්මකින් තොරව මුද්‍රණය කර තිබූ ශාක නාම පුවරු තොගයක් වසර 06 ක කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.	මෙම නාමපුවරු වසර කිහිපයකට පෙර පිළියෙල කර තිබූ අතර, ගම්පහ උද්භිද උද්‍යානයේ වනෝද්‍යාන ලේඛනය සැකසූ පසු ඒවා නාම	අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි ඇගයීමකින් තොරව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත් දැන්වීම් පුවරු

		පුවරු නොමැති අදාල ශාක සඳහා සවිකල අතර, ඉදිරියේදී එම නාම පුවරු වල නම් වෙනස් කර උද්‍යානයේ ශාක සඳහා ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන බව.	ඵලදායීව භාවිතා කිරීමට පියවර ගැනීමත් කළ යුතුය.
(උ)	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ එල්ලෙන පාලම අසල ඇති උද්‍යාන පිවිසුම් මාර්ගය සහිත ඉඩමේ හෙක්ටයාර් 0.3658 ක පවරාගත් භූමියෙන් සියයට 68 ක් හෙවත් මෙම භූමියෙන් හෙක්ටයාර් 0.2513 ක් මේ වන විට අනවසර පදිංචිකරුවන් විසින් ස්ථිර ගොඩනැගිලි ඉදිකර භුක්තිවිඳිමින් පැවතුණි.	අදාළ කාර්යය සඳහා භුක්තිවිදීමට පමණක් එකඟතාවයක් ප්‍රකාශ කර තිබූ නමුත් එම අපේක්ෂිත කාර්යය සිදුනොවීම මත වෙනත් ආයතනයකට ලබාදීමට ප්‍රාදේශීය ලේකම් තීරණය කර තිබුණද, නැවතත් එම භූමිය දෙපාර්තමේන්තු වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව.	ඉඩම් නිරවුල් කර ගනිමින් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩාවක් තුල වසර 06 ක කාලයක සිට රු.2,242,500 ක් වටිනා උපකරණයක් නිෂ්කාර්යයව හා ඌන උපයෝජිතව පැවතිණි.	කාබනික ද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍රය මේ වන විට කොම්පෝස්ට් අංගන පරිශ්‍රයේ තබා භාවිතයට ගන්නා බවත්, කුණු රොඩු පිසදා එකතු කිරීමේ යන්ත්‍රය වෙනත් රාජ්‍ය ආයතනයකට ලබාදීමට කටයුතු කරමින් පැවතියද ඒ සඳහා ප්‍රතිචාරයක් ලැබී නොමැති බව.	යන්ත්‍ර හා උපකරණ ඵලදායීව උපයෝජනය කිරීමේ වැඩපිළිවෙලක් යෙදීමටත් අනවශ්‍ය යන්ත්‍ර වෙනත් අවශ්‍යතා පවතින ආයතන වෙත ලබා දීමටත් පියවර ගත යුතුය.
(එ)	උද්භිද උද්‍යාන 04 ක් සතුව පවතින රු.15,080,380 ක් වටිනා ගොල්ෆ් කාර් රථ 08 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි ගොල්ෆ් කාර් රථ 02 ක් ඇතුළුව ගොල්ෆ් කාර් රථ 10 ක් මාස 01 ත් අවුරුදු 03 ත් අතර කාල පරාසයක් තුල භාවිතයෙන් තොරව පැවතීම හේතුවෙන් උපයාගත හැකිව තිබූ ගොල්ෆ් කාර් රථ ආදායම අහිමි වී ගොස් තිබුණි.	අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව හා සීතාවක උද්භිද උද්‍යානය සතු බැටරි කාර් 02 ක අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	ගොල්ෆ් කාර් රථ කඩිනමින් අළුත්වැඩියා කර සේවයේ යොදවා ආදායම් ප්‍රභවයන් ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඒ)	සීතාවක තෙත් කලාපිය උද්භිද උද්‍යානයට අයත් හෙක්ටෙයාර 0.5015 ක ඉඩමක් හා හක්ගල උද්භිද උද්‍යානයට අයත් හෙක්ටෙයාර 49.564 ක ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් භුක්ති විදින නමුත්, මෙම ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි	ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව හා ඉඩම් ආරක්ෂා කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	ඉඩම් නිරවුල් කර ගනිමින් අයිතිය ගහවුරු කර ගැනීමට හා ඉඩම් ආරක්ෂා කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.

(ඔ)	ගම්පහ උද්භිද උද්‍යානය සතුව පවතින කැබ් රථයක් හා හක්ගල උද්භිද උද්‍යානය සතුව පවතින මෝටර් රථයක් අළුත්වැඩියා නොකර පිළිවෙලින් අවුරුදු 01 මාස 04 ක් සහ අවුරුදු 01 ක කාලයක් ගතවී තිබුණද, එම රථ අළුත්වැඩියා කටයුතු අවසන් කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අළුත්වැඩියාවට අවශ්‍ය කටයුතු ඉටුකර දෙන ලෙස අදාළ අංශ දැනුවත් කර ඇති බව.	අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.
(ඕ)	අනුක ජීව විද්‍යාගාරයේ නිස්සාරණය කරන ලද DNA සාම්පල පරීක්ෂා කිරීම සඳහා වසර 02 ක වගකීමකට යටත්ව රු.640,000 ක මුදලකට ඉකුත් වර්ෂයේ මිලදීගත් Page Unit උපකරණය අවුරුදු 02 ක් වූ වගකීම් කාලයෙන් එක් අවුරුද්දක් අවසන් වී තිබුණද මේ වන විට එක් පර්යේෂණයක් පමණක් සිදුකර තිබුණි.	විශේෂිත වූ ජාන පරීක්ෂණ සඳහා පමණක් මෙම උපකරණය උපයෝගි කරගන්නා බවත්, ප්‍රමාණවත් පරිදි නිලධාරීන් සේවයේ සිටිනම් මෙම උපකරණය ඵලදායී පර්යේෂණ සඳහා යොදාගැනීමට හැකි බව.	ප්‍රමාණවත් පරිදි පුහුණු නිලධාරීන් සේවයේ යොදවා අපේක්ෂිත අරමුණු වෙනුවෙන් යන්ත්‍රය උපයෝජනයට පියවර ගත යුතුය.
(ඖ)	ශාකාගාරයේ වියලි නිදර්ශකයන්ට බාර්කෝඩ් ලේබල් යොදා ඩිජිටල් ඡායාරූපගත කිරීමේ අරමුණ වෙනුවෙන් කැමරා 02 ක් සහ Digitizing Copy Stand 02 ක් පැවතියද, 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එහි භාවිතය පරීක්ෂාවේදී ඩිජිටල් ඡායාරූපගත කිරීමේ ප්‍රගතිය 2021 සාපේක්ෂව සියයට 78 ක් අඩුවී තිබුණි.	කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හා උපකරණයේ ඇති වූ කාර්මික දෝෂය පිළිසකර කිරීමට මාස 05 ක පමණ කාලයක් ගතවීම හා භාවිතා කරන වර්ණ කාඩ් පත්‍රය මිලදී ගැනීමට නොහැකිවීම වැනි කරුණු නිසා ප්‍රගතිය අඩුවී ඇති බව.	විධිමත් වැඩපිළිවෙලක් යොදා වත්කම අරමුණුගත කාර්යයට ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය.

4.4 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව රජයට හානියක් හෝ පාඩුවක් සිදුවූ වහාම එහි ප්‍රමාණය, හේතු, වගකිවයුතු පාර්ශවයන් කඩිනමින් හඳුනාගෙන රජයට සිදුවන හානිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (i) හි පාඩු හා අත්හැරීම් ප්‍රකාශනය තුළ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් පවතින අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති හානි හා පාඩු 26 ක් සම්බන්ධයෙන්	2024.12.31 දිනට තව දුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට ඇති හානි සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කිරීමට අතපසු වූ බව හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට අදාළ විෂයයන් වෙත උපදෙස් ලබා දුන් බව.	පාඩු හා හානි නිවැරදිව වාර්තා නොකිරීම හා විධිමත් පරිදි කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, හානි හා පාඩු පිළිබඳ පරීක්ෂණ කඩිනම් කර නිර්දේශ මත අදාල පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.

	හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම එම හානි හා පාඩුවල අයකරගැනීමේ කාල විශ්ලේෂණයද මූල්‍ය ප්‍රකාශනය තුළ හෙළිදරව් කර නොතිබුණි.		
(ආ)	මුදල් රෙගුලාසි 104 (3) යටතේ අලාභයක් සිදුවූ වහාම එම අලාභයට අදාළ හේතු ඇතුළත් කරමින් අලාභය සිදුවූ දින සිට දින 07ක කාලයක් තුල පූර්ණ වාර්තාවන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් අලාභය සිදුවූ වහාම ප්‍රාරම්භක වාර්තා නිකුත් කිරීමට කටයුතු කළ යුතු වුවද, හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානයේ 2010 දෙසැම්බර් 21 දින සිදුවූ වත්කම් අස්ථානගතවීමක් සම්බන්ධයෙන් වසර 13 ක කාලයක් ගතවූ පසු ප්‍රාරම්භක වාර්තා නිකුත් කර තිබුණි.	පරීක්ෂණයක් සිදු කර ඇති බව ලොග් පොතෙහි සටහන් කර තිබුණද, තොරතුරු සොයා ගත නොහැකි වූ බැවින් ඌනතාවය ඒකකයේ බඩු වට්ටෝරු පොතෙහි ඇතුලත් කර ඇති බව හා මු.රෙ. 104(4) පරීක්ෂණයක් සිදු කර එහි නිර්දේශ පරිදි පොතෙන් කපා හැරීමට 2025 ජනවාරි 24 දින අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාදී ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත්, අලාභහානිය සම්බන්ධ පරීක්ෂණ කඩිනමින් නිම කිරීමටත් පියවර ගත යුතුය.

4.5 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ එල්ලෙන පාලම අසල ඇති උද්‍යාන පිවිසුම් මාර්ගය සහිත ඉඩමෙන් යටිනුවර ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත 2020 ඔක්තෝබර් 08 දින හෙක්ටයාර් 0.3658 ක භූමිය වාහන ගාල්කිරීම සඳහා පවරාදී වසර 04 ක කාලයක් ගතවී ඇතත්, මෙම ඉඩම අරමුණුගත කාර්යය වෙනුවෙන් භාවිත කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අදාළ කාර්යය සඳහා භුක්තිවිඳීමට පමණක් ලබාදීමට එකඟතාවයක් ප්‍රකාශ කර තිබූ නමුත් එම භූමියෙහි අපේක්ෂිත කාර්යය සිදුනොවීම මත වෙනත් ආයතනයකට ලබාදීමට ප්‍රාදේශීය ලේකම් තීරණය කර තිබුණද, නැවතත් එම භූමිය දෙපාර්තමේන්තු වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව.	අදාල භූමිය අරමුණුගත කාර්යය සඳහා යෙදවීමට කඩිනම් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාවට නැංවිය යුතුය.
(ආ)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතට අයත් අධ්‍යක්ෂ කාර්යාලයක් වශයෙන් පැවති උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව 2006 නොවැම්බර් 10 දිනැතිව අංක 1471-	ගොඩනැගිලි 02 උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට ඉල්ලීම් කර තිබුණද, එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කර තිබූ බව හා	අදාල ආයතන සමඟ සාකච්ඡා කර දේපළ අයිතිය විධිමත් පරිදි නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

	2006 දරන සාමාන්‍ය ගැසට් පත්‍රය මගින් නව දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රකාශයට පත්කර වසර 18 ක කාලයක් ඉක්මගොස් ඇතත්, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල ස්ථාපිත කර තිබූ කෘෂිකර්ම අධ්‍යක්ෂ නිල නිවාසය හා කෘෂි ප්‍රකාශන ඒකකය, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	තවදුරටත් මේ පිළිබඳව විමසා තිබුණද, සාකච්ඡාවක් සඳහා අවස්ථාවක් ලබාදී නොමැති බව.	
(ඇ)	මල් වගා පර්යේෂණ හා සංවර්ධන අංශය තුල කල් ඉකුත් වී භාවිතයට ගත නොහැකි (ලේබල් රහිත) හඳුනාගත නොහැකි රසායන ද්‍රව්‍ය 37 ක්ද, කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය 69 ක් ද පැවති අතර, එම රසායන ද්‍රව්‍ය නිසි ක්‍රමවේදයන්ට අනුව බැහැර කිරීමට දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.	මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලත් ආයතනයක් මගින් රසායන ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරගෙන යන බව.	විධිමත් පරිදි කටයුතු කර නිසි ක්‍රමවේදයකට අනුව බැහැර කිරීමේ වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.
(ඈ)	ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය අනුව නිවාස කුලී අයකළ යුතු අතර එහිදී 5.6 වගන්තිත් අනුව ආර්ථික කුලිය නියම කිරීමට ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලබාගත යුතුය. ඒ අනුව රාජකීය උද්භිද උද්‍යානය සතුව පවතින සේවක නිල නිවාස 18 ක් සඳහා රු.1,000 ක මාසික ආර්ථික කුලියක් අයවන අතර මෙම ආර්ථික කුලිය 2016 දෙසැම්බර් 02 දිනැති ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන අයකර තිබූ අතර, එම තක්සේරු ඉදිරි වසර 02 ක කාලයක් සඳහා පමණක් වලංගුව පැවති බැවින් නව තක්සේරුවක් ලබාගත යුතු කාලය වසර 05 කින් ඉක්මවා තිබුණද, 2025 පෙබරවාරි 25 දින වන විටද ආර්ථික කුලිය තක්සේරු කර වාර්තාවක් ලබාගෙන නොතිබුණි. නව තක්සේරුවක්	තක්සේරු කාල සීමාව අවසන් වී ඇති සියළු නිල නිවාස සඳහා නව තක්සේරු වාර්තා ලබාගන්නා ලෙසත් ලැබී නොමැති නම් සිහිකැඳවීම් යවන ලෙසට උපදෙස් දී ඇති බව හා තක්සේරු වාර්තා ලැබෙන තෙක් ආයතන සංග්‍රහයට අනුව නිවාස කුලී අයකර ගැනිමට සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	කාලීනව තක්සේරු වාර්තා ලබා නොගෙන ආර්ථික කුලිය අය කිරීමට අදාල වගකිවයුතු නිලධාරීන්ට පියවර ගැනීමටත්, තක්සේරු වාර්තා කැඳවා ආර්ථික කුලිය යාවත්කාලීනව අය කිරීමටත් පියවර ගත යුතුය.

ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් නව තක්සේරුව අනුව රජයට ලැබිය යුතු නිවාස කුලී ආදායම අහිමිවී තිබුණි.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව පිහිටුවා තිබූ තිරසර සංවර්ධන අරමුණු (SDG) 04 ක් සඳහා පිහිටුවා ඇති එක් එක් දර්ශකයන් සාර්ථක කර ගැනීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී දර්ශක 03 ක ප්‍රගතිය සියයට 63 ත් සියයට 80 ත් අතර විය.	නිලධාරීන්ගේ හිඟය, පුහුණු පාඨමාලා සඳහා ඉල්ලුම අඩුවීම, නිෂ්පාදන පිරිවැය වැඩිවීම හා සුදුසුකම් සහිත පුද්ගලයන් නොමැතිවීම හේතුවෙන් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව.	තිරසර අරමුණු ලඟාකර ගැනීමට සඳහා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 964 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 736 කි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් 08 ක් ද ඇතුළුව පුරප්පාඩු 168 ක් පැවති අතර, අතිරික්ත නිලධාරීන් 10 ක් විය.	පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර තථ්‍ය කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හා අවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.